# 2014 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | iii |
| | කාර්යයන් | iv |
| 1. | රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන්- 2014 | 01 |
| 2. | 2014 වර්ෂයේ කාර්යසාධනය | 05 |
| 3. | පාලන හා ගිණුම් | 11 |

# දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක්

ස්ථාපිතවීම සහතික කිරීම

# මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියා රාමුව තුළ

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

# කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තරනියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම;

- බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණ පනත් සකස් කිරීම, (තීරු බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර);

- රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය; සහ

- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.

# 1. රාජ්‍ය මූල්‍යප්‍රවණතාවයන් - 2014

## 1.1. සමාලෝචනය

මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලව, ආදායම ඉහළ නැංවීම සහ රාජ්‍ය වියදම් මනා ලෙස කළමනාකරණය කිරීම මගින් විචක්ෂණශීලීව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හැසිරවීම තුළින් දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස 2013 වර්ෂයේ දී සියයට 5.9 ක් වූ අයවැය හිඟය 2014 වර්ෂයේ දී සියයට 5.2 දක්වා තවදුරටත් අඩු කිරීමට අපේක්ෂා කරන ලදී.

රාජ්‍ය ආදායම නාමික වශයෙන් 2013 වර්ෂයේ දී පැවති රු. බිලියන 1,137 සිට 2014 වර්ෂයේ දී රු. බිලියන 1,195 දක්වා සියයට 5.1 කින් වැඩි වූ අතර, රාජ්‍ය වියදම 2013 වර්ෂයේ දී රු. බිලියන 1,669 සිට 2014 වර්ෂයේ දී රු. බිලියන 1,759 දක්වා සියයට 7.6 කින් වැඩි විය. මේ හේතුව නිසා 2014 වර්ෂයේ දී අයවැය හිඟය ද.දේ.නි සියයට 0.7 ක සුළු ඉහළ යාමට හේතු වී ඇත. රජයේ මුළු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වර්ෂයේ දී පැවති සියයට 13.1 සිට 2014 වර්ෂයේ දී සියයට 12.2 දක්වා පහළ ගිය අතර, බදු ආදායම 2013 වර්ෂයේ දී පැවති සියයට 11.6 සිට සියයට 10.7 දක්වා සැළකිය යුතු ලෙස අඩු විය. මෙම මන්දගාමී ක්‍රියාකාරිත්වය සඳහා සංස්ථාපිත ආදායම් බදු, රඳවා ගැනීමේ බදු, ආනයන තීරු බදු ආදායමේ අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. කෙසේ වුවද, රජයට අයත් ව්‍යාපාර ආයතනවල ලාභ සහ ලාභාංශ ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස බදු නොවන ආදායම 2013 වර්ෂයේ දී සියයට 7.7 කින් අඩු වුවද, 2014 වර්ෂයේ දී සියයට 10.1 කින් රු. බිලියන 145දක්වා වැඩි විය. දේශීය ආර්ථික කටයුතු වල ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ ද, තෝරාගත් අංශවලට බදු නිදහස් කිරීම් සහ බදු සහන ලබාදීම, සහ බදු පරිපාලනයේ දුර්වලතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස බදු ගෙවීම පැහැර හැරීම රජයේ ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

රාජ්‍ය වියදම පිළිබඳව සලකා බැලීමේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම් 2013 වර්ෂයේ දී පැවති සියයට 13.9 සිට 2014 වර්ෂයේ දී සියයට 13.5 දක්වා අඩු විය. අඩු උද්ධමන වාතාවරණය මත ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ ලිහිල් මුදල් ප්‍රතිපත්තිය යටතේ අඩු පොලී අනුපාතිකයක් පවත්වා ගැනීම, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ දී සියයට 5.1 ක් වූ පොලී ගෙවීම් 2014 වර්ෂයේ දී සියයට 4.5 දක්වා අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කෙසේ වුවද, 2014 වර්ෂයේ දී රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම හේතු කොට ගෙන වැටුප් හා වේතන සඳහා වූ වියදම් ඉහළ යන ලදී. පුනරාවර්තන වියදම් නාමික වශයෙන් 2013 වර්ෂයේ දී පැවති රු. බිලියන 1,205 සිට 2014 වර්ෂයේ දී රු. බිලියන 1,323 දක්වා සියයට 9.8 කින් වැඩි වී ඇත. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් හිඟය පසුගිය වසරේ වාර්තා වූ සියයට 0.8 ඉක්මවා යමින් 2014 වර්ෂයේ දී සියයට 1.2 දක්වා ඉහළ යන ලදී. ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් නාමික වශයෙන් රු. බිලියන 473 දක්වා සියයට 1.9 කින් සුළු වශයෙන් ඉහළ යාමක් පෙන්නුම් කළ ද, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කල 2013 වර්ෂයේ දී වාර්තා වූ සියයට 5.4 සිට 2014 වර්ෂයේ දී සියයට 4.8 දක්වා අඩු විය. මීට අමතරව, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන 2013 වර්ෂයේ දී වාර්තා වූ සියයට 5.5 ට සාපේක්ෂව 2014 වර්ෂයේ දී සියයට 5.0 දක්වා අඩු විය. රාජ්‍ය ආදායමේ අඛණ්ඩ දුර්වල ක්‍රියාකාරිත්වයේ අහිතකර බලපෑම හේතු කොට ගෙන ප්‍රාග්ධන වියදම් හි සිදු වූ පහළ යාම මගින් පිළිබිඹු කරනුයේ සමස්ත අයවැය හිඟය සඳහා අයවැයෙහි අපේක්ෂිත අගය වූ රු. බිලියන 516 ට සාපේක්ෂව 2014 වර්ෂයේ දී එය රු. බිලියන 591 දක්වා වර්ධනය වී ඇත.


## 1.2. රාජ්‍ය ආදායම්

ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායමෙහි අඩුවීම පිළිබිඹු කරමින් 2013 වර්ෂයේ දී වාර්තා කරන ලද සියයට 13.1 කට සාපේක්ෂව 2014 වර්ෂයේ දී මුළු රාජ්‍ය ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.2 ක් දක්වා අඩු වී ඇත. 2013 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. බිලියන 1,137 ට සාපේක්ෂව 2014 වර්ෂයේ දී සියයට 5.1 ක වර්ධනයක් සහිතව රු. බිලියන 1,195 ක මුළු ආදායමක් රැස්කර ගත හැකි විය. ඊට අමතරව, බදු ආදායම සියයට 4.4 කින් එනම්, රු. බිලියන 1,050 දක්වා වැඩි වූ අතර, බදු නොවන ආදායම ද සියයට 10.1 කින් එනම්, රු. බිලියන 145 දක්වා වැඩි විය. කෙසේ වුවද, 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව හා සසඳන කළ මුළු ආදායම් එකතුවේ රු. බිලියන 242 ක පමණ හිඟයක් පෙන්නුම් කරන ලදී.

### බදු ආදායම

2013 වර්ෂයේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.6 ක්ව පැවති මුළු බදු ආදායම, 2014 වර්ෂයේ දී සියයට 10.7 දක්වා අඩු වී ඇත. මුළු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් බදු ආදායම 2013 වර්ෂයේ දී සියයට 88.4 ක්ව පැවති අතර, එය 2014 වර්ෂයේ දී සියයට 87.8 දක්වා අඩු වී ඇත. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු, පොලී ආදායම මත බදු, සිගරට් සඳහා වන නිෂ්පාදන බදු සහ ආනයන තීරු බදු මඟින් ලද බදු ආදායම අඩුවීම මෙම මන්දගාමී කාර්ය සාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කෙසේ වෙතත්, උපයන විට ගෙවීමේ බදු, එකතු කළ අගය මත බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, සෙස් බද්ද, මද්‍යසාර, වාහන සහ ඛනිජ තෙල් සඳහා වන නිෂ්පාදන බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ විදුලි සංදේශ බදු වැනි බදු වර්ග වල කාර්ය සාධනය 2014 වර්ෂය තුල දී වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**රූප සටහන 1: රාජ්‍ය ආදායම**



වගුව 1:රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය - 2014 (රු. මිලියන)

| අයිතමය | 2013 | 2014 ඇස්තමේන්තු | 2014 තථ්‍ය | හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 205,666 | 264,400 | 198,115 | උපයන විට ගෙවීම් බදු ආදායම වර්ෂය තුලදී වැඩි වූ අතර, බදු අනුකූලතාවය ඉහළ යාම සමඟ එක්වූ අපනයන, තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාදාමයන් බැහැරදීම්, වෘත්තීයමය සේවාවන්, බැංකු වැනි ඉහළ ඉපයීම් ගණයට අයත් අංශවල රැකියාවන් පුළුල් වීම සහ ඉහළ වැටුප් ඒ සඳහා හේතුවිය. භාණ්ඩාගාර බැදුම්කර හා බිල්පත් නිකුත් කිරීම අඩුවීම නිසා පොලී මත බදු ආදායම අඩුවීම, ආදායම් බදු වල සෘණාත්මක වර්ධනයකට දායක විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ සංස්ථා වල වර්ධනය ඉලක්ක කර ගනිමින් බදු අනුපාත අඩු කිරීම් හා නිදහස් කිරීම් ලබාදීම ද ආදායම් බදු සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී. |
| එ.අ.බ. (VAT) | 250,523 | 290,000 | 275,350 | දේශීය ක්‍රියාකාරකම් තුලින් වන එකතු කල අගය මත බදු ආදායම වැඩිවීම සඳහා නිෂ්පාදන, මූල්‍ය සේවා, හෝටල්, අවන්හල් සහ තොග හා සිල්ලර වෙළඳාම වැනි අංශ වල වඩාත් පුළුල් ක්‍රියාකාරීත්වය උපකාරී විය. දෙමුහුන් (හයිබ්‍රිඩ්) මෝටර් රථ සඳහා වන ඉල්ලුම වැඩිවීමෙහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථ ආනයනය වැඩි වූ අතර එය 2014 වර්ෂයේ මුල් භාගයේ දී එකතු කල අගය මත බදු ආදායම මත ධනාත්මක ලෙස බලපාන ලදී. කෙසේ වෙතත් 2014 ඔක්තෝබර් මාසයේ සිට බදු ව්‍යුහය ඒකාබද්ධ කිරීමේ ක්‍රමවේදයක් ලෙස මෝටර් රථ ආනයනයේදී අදාල වන එකතු කල අගය මත බදු හා වෙනත් බදු වර්ග කිහිපයක් අහෝසි කිරීමේ ප්‍රතිපත්තිය මගින් එකතු කල අගය මත බදු ආදායම වසරේ අපේක්ෂිත ආදායම අඩු වීමට බලපා ඇත. |
| නිෂ්පාදන බදු | 250,700 | 252,035 | 256,691 | මත්පැන් හා දුම්කොළ මත වූ නිෂ්පාදන බදු වැඩි වීම හා මෝටර් රථ ආනයනය ඉහළ යාම, නිෂ්පාදන ආදායම්වල ඉහළ වර්ධනයට හේතු විය. |
| ආනයන බදු | 83,123 | 85,000 | 81,108 | ආනයන බදු තුලින් ලද ආදායම අඩු වීම සඳහා යන්ත්‍රෝපකරණ සහ උපාංග ගොඩනැගිලි ද්‍රව්‍ය සහ අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයනය අඩුවීම ප්‍රධාන |


| | | | | |
|---|---|---|---|---|
| | | | | වශයෙන් බලපාන ලදී. ඒ සමගම ආසියා පැසිපික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියාතික නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) මෙන්ම ඉන්දියාව හා පාකිස්ථානය වැනි රටවල් සමග එළඹ ඇති නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ සාමාන්‍ය බදු හෝ බදු නිදහස් ලෙස ආනයනය කරනු ලබන නිෂ්පාදන සහ ආයෝජන ගිවිසුම් යටතේ බදු නිදහස් අයිතම ආනයන කිරීම ද ආදායම අඩුවීම කෙරෙහි බලපෑ සාධක විය. |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද (PAL) | 61,987 | 80,000 | 68,646 | මෙම ආදායම වැඩිවීම සඳහා පාරිභෝගික භාණ්ඩ, ඉන්ධන, තෙල්, රෙදිපිළි සහ වෙනත් අදාල ද්‍රව්‍ය වල ආනයන වැඩි වීම ප්‍රධාන වශයෙන් දායක විය. |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) | 40,937 | 45,600 | 44,583 | 2014 වර්ෂයේ ජාතිය ගොඩනැගීමේ බද්ද තුලට මූල්‍ය සේවා ඇතුලත් කිරීම තුලින් ජාතිය ගොඩනැගීමේ බදු ආදායම වැඩි වීම කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කරන ලදී. එමෙන්ම සිල්ලර වෙළදාම සහ බෙදාහැරීම්, සේවා සහ කුලී නිෂ්පාදන, හෝටල් සහ ආපනශාලා වැනි නිශ්චිත අංශ වල වඩාත් හොඳ ක්‍රියාකාරීත්වයද මෙම ධනාත්මක වර්ධනය සඳහා දායක විය. |
| අනෙකුත් බදු | 159,664 | 177,440 | 125,869 | විදුලි සංදේශ සේවා භාවිතය ඉහළ යාම සහ බදු අනුපාත ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස විදුලි සංදේශ බදු වලින් ලද ආදායම වැඩි විය. දේශීය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තෝරාගත් අයිතම වල බදු අනුපාත සංශෝධනයන් සහ නව අයිතම විශේෂ වෙළඳ භාණ්ඩ බදු යටතේ ලැයිස්තුගත කිරීම විශේෂ වෙළඳ භාණ්ඩ බදු තුලින් ලද ආදායම වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. එමෙන්ම සෙස් බදු ආදායම වර්ධනය වීම ද මෙම ආදායම ඉහළ යාමට හේතු විය. |
| බදු නොවන ආදායම් | 131,552 | 152,025 | 144,844 | බදු නොවන ආදායම් වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් රජයට අයත් ව්‍යාපාර ආයතන ව්‍යාපාර වල ලාභ සහ ලාභාංශ, පොලී සහ කුලී ආදායම් වැඩිවීම හේතු විය. කෙසේ වුවද, මේ ලාභාංශ අඩුවීම නිසා මහ බැංකුවේ ලාභාංශ පැවරුම් මත වූ බදු නොවන ආදායම අඩු වන ලදී. |

## 2. 2014 වසරේ කාර්ය සාධනය

### 2.1. ආදායම් රැස් කිරීමේ කාර්යයෙහි නිරත සියලු දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රජයේ ආදායම් වර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම

2014 වර්ෂයේ මුළු රාජ්‍ය ආදායම රු. බිලියන 1,195 කි. එය 2013 වර්ෂයේ රු. බිලියන 1,137හා සැසඳීමේ දී සියයට 5.1ක වැඩිවීමකි. මුළු රාජ්‍ය ආදායමෙන් බදු ආදායම රු. බිලියන 1,050 ක් වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 145 ක් විය.

රූප සටහන 2:බදු ආදායමේ සංයුතිය - 2014




### 2.2. රාජ්‍ය ආදායම් සාරාංශය

වගුව 2: රාජ්‍ය ආදායම

රු. මිලියන

| අයිතමය | 2013 | 2014(තථ්‍ය) |
|---|---|---|
| **බදු ආදායම** | **1,005,895** | **1,050,362** |
| ආදායම් බදු | 205,666 | 198,115 |
| එකතු කළ අගය මත බදු | 250,523 | 275,350 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 40,937 | 44,583 |
| නිෂ්පාදන බදු | 250,700 | 256,691 |
| ආනයන බදු | 83,123 | 81,108 |
| වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු | 61,987 | 68,646 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 46,705 | 47,953 |
| අනෙකුත් | 66,255 | 77,916 |
| **බදු නොවන ආදායම** | **131,552** | 144,844 |
| පොලී/කුලී | 11,995 | 13,647 |
| ලාභ සහ ලාභාංශ | 35,169 | 46,814 |
| විකුණුම් සහ ගාස්තු | 40,720 | 35499 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 15,145 | 14,919 |
| මහ බැංකු පැවරුම් | 26,350 | 11,500 |
| අනෙකුත් | 2,173 | 22,466 |
| **මුළු ආදායම** | **1,137,447** | **1,195,206** |

## 2.3. රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව බදු සම්බන්ධ නීතීන්ට සිදු කරන ලද සංශෝධන

### 2.3.1. මෙම දෙපාර්තමේන්තුව විසින් 2014 වසර තුළදී නිකුත් කරන ලද ගැසට් නිවේදන

**(i) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)පනත**

- **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2014.01.20 දිනැති අංක 1846/7 දරන ගැසට් නිවේදනය)**- සිංගල් කැබ් රථ සඳහා පවතින බදු අනුපාත එලෙසම පවත්වා ගනිමින් නව බදු අනුපාතයන් හඳුන්වා දීමේ අරමුණින් ලොරි සහ ට්‍රක් රථ සඳහා වෙනම උප ශීර්ෂයක් හඳුන්වා දෙන ලදී. තවද, පළාත් පාලන ආයතන වැඩි වශයෙන් භාවිතා කරනු ලබන ගලි බවුසර් සහ සඳහා වන බදු අනුපාත පහළදැමීමේ අරමුණින් නව රේගු අංකනයක් හඳුන්වා දෙන ලදී. දේශීය එකතු කළ අගයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එන්ජින් සවි කල වාහන චැසි සහ කැබ් සඳහා වෙනම රේගු ශීර්ෂයන් හඳුන්වා දුන් අතර, එහි බදු අනුපාතය ඉහළ දැමීම සහ ඖෂධ ඇසුරුම් පටල, සනීපාරක්ෂක තුවා, හා ටැම්පෝන ආදියෙහි බදු සංශෝධනය කරන ලදී.

- **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2014.10.09 දිනැති අංක 1883/8 දරන ගැසට් නිවේදනය)** - දුම්කොළ වලින් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ඉහළ නැංවීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2014.10.24 දිනැති අංක 1885/42 දරන ගැසට් නිවේදනය)** - රේගු බදු මාර්ගෝපදේශයෙහි 87 වන පරිච්ඡේදයේ සඳහන් ඇතැම් අයිතම සඳහා එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, සෙස් බද්ද, තීරු බද්ද සහ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද වෙනුවට නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත් කිරීම.

- **1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2014.10.24 දිනැති අංක 1885/43 දරන ගැසට් නිවේදනය)** - උපලේඛනයෙහි සඳහන් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ නිෂ්පාදන බද්දෙන් නිදහස් කිරීම ප්‍රකාශයට පත් කිරීම.

**(ii) සෙස් බදු**

- **1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2014.01.20 දිනැති අංක 1846/6 දරන ගැසට් නිවේදනය)** - දේශීය ඖෂධ නිෂ්පාදන කර්මාන්තයදිරිගැන්වීම අරමුණු කොට ගෙන ඖෂධ ඇසුරුම් පටල සඳහා පනවා තිබූ ආනයන සෙස් බදු ඉවත් කළ අතර, දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ අරමුණින් තෙත් පිරිසිදු කිරීමේ කඩදාසි, සනීපාරක්ෂක තුවා සහ ටැම්පෝන සඳහා පනවා තිබූ සෙස් බදු අඩු කරන ලදී.

- **1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2014.10.24 දිනැති අංක 1885/46 දරන ගැසට් නිවේදනය)** - දේශීය රසකැවිලි නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ආනයන බද්ද ඉවත් කිරීම සහ දේශීය නිෂ්පාදන ඉහළ නැංවිමට මත්පැන් සහ රබර් සඳහා සෙස් බද්ද ඉහල නැංවීම.

**(iii)** සුරාබදු

- **අංක 962 දරන සුරාබදු නිවේදනය (2014.01.20 දිනැති 1846/8 දරන ගැසට් නිවේදනය)** - සුරාබදු පනත අනුව බදු ගෙවිය යුතු ආකාරය සංශෝධනය කරන ලදී. ඒ අනුව, සියලුම මත්පැන් නිෂ්පාදකයින් එක් මාසයක පළමු දින 15 ක නිෂ්පාදන සම්බන්ධ සුරාබද්ද එම මස අවසන් දින හෝ ඊට පෙර ද, මාසයේ ඉතිරි දිනවල නිෂ්පාදන සම්බන්ධව ඊළඟ මාසයේ 15 වන දින හෝ ඊට පෙර ද අදාල සුරාබදු ගෙවිය යුතු වන්නේය.

- **අංක 963 දරන සුරාබදු නිවේදනය (2014.01.20 දිනැති අංක 1846/9 දරන ගැසට් නිවේදනය)** - රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා ඊතයිල් මධ්‍යසාර ආනයනයේදී බදු නිදහස් සීමාව ලීටර 10,000 දක්වා වැඩි කළ අතර, මත්පැන් නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ආනයනික (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු සඳහා පැවති නිෂ්පාදන බදු විෂමතා අඩු කරන ලදී.

- **අංක 965 දරන සුරාබදු නිවේදනය (2014.10.09දිනැති අංක 1883/7 දරන ගැසට් නිවේදනය)** - ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ විදේශ ස්ප්‍රීතු සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම.

- **අංක 966 දරන සුරාබදු නිවේදනය (2014.10.09දිනැති අංක 1883/7 දරන ගැසට් නිවේදනය)**- නිරපේක්ෂ සැර සියයට 5 ට වඩා අඩු හා නිරපේක්ෂ සැර සියයට 5 සහ ඊට වැඩි ධාන්‍ය මත්පැන් සඳහා බදු සංශෝධනය කිරීම.

- **අංක 967 දරන සුරාබදු නිවේදනය (2014.10.09 දිනැති අංක 1883/7 දරන ගැසට් නිවේදනය)** - සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි වෛද්‍ය සැපයුම් ඒකකය සඳහා භාවිතා කරනු ලබන ස්ප්‍රීතු (ඊතයිල් මද්‍යසාර) ලීටර් 20,000 ක සීමාවක් දක්වා බදු නිදහසක් ලබාදීම සහ මත්පැන් නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන ආනයනික (ඊතයිල් මද්‍යසාර) ස්ප්‍රීතු සඳහා බදු සංශෝධනය කිරීම.

- **අංක 968 දරන සුරාබදු නිවේදනය (2014.10.24දිනැති අංක 1885/44 දරන ගැසට් නිවේදනය)**- (රා හෝ කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණුකොට) මධ්‍යසාර සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම.

- **අංක 969 දරන සුරාබදු නිවේදනය (2014.10.24දිනැති අංක 1885/44 දරන ගැසට් නිවේදනය)** - අංක 964 දරන සුරාබදු නිෂ්පාදන බලපත්‍රලාභී ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම්කල අරක්කු සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම.

- **අංක 970 දරන සුරාබදු නිවේදනය (2014.10.24දිනැති අංක 1885/44 දරන ගැසට් නිවේදනය)**- ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ විදේශ ස්ප්‍රීතු සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම.

- **අංක 971 දරන සුරාබදු නිවේදනය (2014.10.24දිනැති අංක 1885/44 දරන ගැසට් නිවේදනය)**- ධාන්‍ය මත්පැන් සඳහා බදු සංශෝධනය කිරීම.

- **අංක 972 දරන සුරාබදු නිවේදනය (2014.10.24දිනැති අංක 1885/44 දරන ගැසට් නිවේදනය)**- ආනයනය හෝ දේශීය සපයනු ලබන එතිල් මධ්‍යසාර සඳහා ගෙවිය යුතු සුරා බදු සංශෝධනය කිරීම.

**(iv) දේශීය ආදායම් පනත**

- **2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත (2014/04/09 දිනැති අංක 1857/8 දරණන ගැසට් නිවේදනය)**දේශීය ආදායම් පනතේ අදාළ විධිවිධානයන්ට අනුකූලව, 2012 අප්‍රේල් 01 වැනි දින හෝ ඉන්පසුව ආරම්භවන යම් තක්සේරුවර්ෂයකට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.ලං. මූ.වා.ප්‍ර.)/ලංකා ගිණුම් ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අදාළ කර ගැනීමට අනුගතව, බදු කාර්යයන් සඳහා ලාභ සහ ආදායම් නිශ්චය කිරීමේදී සිදු කළ යුතුගැලපීම් හා අවශ්‍ය තොරතුරු

**(v) එකතු කළ අගය මත බද්ද**

- **2014 අංක 07 දරන එකතු කළ අගය මත බදු පනත** - පුද්ගලයෙකු හෝ සිල්ලර හෝ තොග ව්‍යාපාරයක් එකතු කළ අගය මත වූ බදු ගෙවිය යුතු සීමාව රුපියල් මිලියන 25 ට හෝ ඊට වැඩි ලෙසට ඉහළ දැමීම.

- **2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු පනත (2014/06/23 දරන අංක 1868/10 දරන ගැසට් නිවේදනය)** 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා VAT බදු ගණනය කිරීමට විශේෂ උපදෙස් ඇතුලත් අදාල නියෝගය

**(vi) ආර්ථික සේවා ගාස්තු පනත**

- **2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (2014.04.09 දිනැති අංක 1857/9 දරන ගැසට් නිවේදනය)**- යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක නිරත යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් සඳහා පනතේ 2 වන වගන්තිය යටතේ පිරිවැටුම් ගණනය කිරීමේ ක්‍රමවේදය හා නව ආර්ථික සේවා ගාස්තු මත සියයට 2.5 ක් ඇතුලත් වගුව සංශෝධනය කිරීම.
- **2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (30.09.2014 දිනැති අංක 1882/17 දරන ගැසට් නිවේදනය)** - යම් සමාගමක ඕනෑම කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම මත නිකුත් කළ ඕනෑම කොටස් සහතිකයක් සඳහා ගාස්තු සංශෝධනය කිරීම.

**(vii) 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත**

- **2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත (2014.05.29 දිනැති 1864/45 දරන ගැසට් නිවේදනය)** - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2013 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

- **2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත (2014.06.30 දිනැති 1869/5 දරන ගැසට් නිවේදනය)** - 2014 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

- **2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත (2013.10.24 දිනැති 1885/41 දරන ගැසට් නිවේදනය)** - 2015 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

**(viii)** **මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත**

- **2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන පනත) 2014.05.26 දිනැති අංක 1864/2 දරන ගැසට් නිවේදනය** - 2006 ඔක්තෝම්බර් 05 වන දින අංක 1465/19 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් 2006.05.10 දිනැති අංක 1807/19 දරන ගැසට් නිවේදනයේ අවසන් වරට සංශෝධනය කරන ලද පරිදි යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක් සඳහා එහි වෙළෙඳපොළෙහි උපයා ගත හැකි වටිනාකමට මුද්දර ගාස්තු අය කිරීම.

- **2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත** - 2014.09.01 දිනැති අංක 1878/3 දරන ගැසට් නිවේදනය - පෙර ගැසට් නිවේදන නැවත අංකනය කිරීම සහ නව අයිතම එකතු කිරීම.

**(ix)විදුලි සංදේශ බදු පනත**

**2011 අංක 21 දරණ විදුලි සංදේශ බදු පනත සඳහා වන සංශෝධන -**
2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ බද්ද සඳහා පවතින බදු අනුපාතය සියයට 20 සිට 25 දක්වා වැඩි කිරීම

**(x)ආදායම් සංරක්ෂණ පනත**

**1972 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** (2014.01.20 දිනැති අංක 1846/10 දරන ගැසට් නිවේදනය) - භාණ්ඩ ප්‍රවාහනයට යොදා ගන්නා ලොරි හා ට්‍රක් රථ වෙන්කර හඳුනාගැනීමට නව රේගු සංකේතාංක ඇතිකර ඒවාට අඩු බදු අනුපාතයන් (මුළු බදු අගය 38% හා 55% වශයෙන්) ක්‍රියාත්මක කිරීමත්, සිංගල් කැබ් රථ සඳහා පැවති බදු ප්‍රමාණය (මුළු බදු අගය 125% වශයෙන්) එලෙසම පවත්වා ගැනීමට කටයුතු කිරීම, පළාත් පාලන ආයතන සඳහා වැඩි වශයෙන් යොදාගනු ලබන කසල අපහරන රථ, ගලි බවුසර සඳහා නව රේගු සංකේතාංක ඇතිකර ඒවාට අඩු බදු අනුපාතයන් අයවන ලෙස බදු ව්‍යුහය ගැලපීම, එන්ජින් සහ කුටි සවිකළ වාහන චැසි සඳහා නව රේගු සංකේතාංක ඇති කර දේශීය අගය එකතු කිරීම දිරිමත් වන අයුරින් බදු අනුප්‍රමාණ පැනවීම සහ බදු අනුප්‍රමාණ පැනවීම සහ ඖෂධ ඇසුරුම් පටල, ළදරුවන් සහ වැඩිහිටියන් සඳහා බහිස්‍රාවිය ද්‍රව්‍ය අවශෝෂක ආස්තරණ සඳහා බදු සංශෝධනය කිරීම.

**2.4.** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. එසේම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අදාළව ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දිය යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ පිළියෙල කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

2.5. **විවිධ බදු සම්බන්ධ පනත් කෙටුම්පත් සහ ගැසට් පත්‍ර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ ඊට අනුගාමී ක්‍රියා මාර්ග ගැනීම.**

- බදු පිළිබඳ ව්‍යවස්ථාවන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, ගරු නීතිපතිතුමා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, රජයේ මුද්‍රණාලය සහ පාර්ලිමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරමින් අදාළ කටයුතු සිදු කරන ලදී.

- බදු/ගාස්තු ප්‍රතිශෝධනයට අදාළ ගැසට් නිවේදනයන් 2014 වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

**2.6 සියලු ආදායම් ප්‍රභවයන් සමාලෝචනය කිරීම, ආදායම් පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා පිළියෙල කිරීම, ආදායම් ඇස්තමේන්තු හා මුදල් ප්‍රවාහ තත්ත්වය අධීක්ෂණය කිරීම.**

- 2015 වර්ෂය සඳහා නියමිත ආදායම් ඇස්තමේන්තු, ආදායම් රැස්කිරීමේ දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සකස් කරන ලදී.

- භාණ්ඩාගාර ලේකම්වරයා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආදායම් රැස්කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අනෙකුත් අදාළ ආයතනවල සහභාගිත්වයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවෙහි රැස්වීම් හතරක් (කාර්තුමය වශයෙන්) පවත්වන ලදී.

- ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය මාසික ආදායම් වාර්තා මගින් සහ විශේෂ තොරතුරු ලබා ගැනීම මගින් ද අධීක්ෂණය කළ අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවශ්‍යවන කාර්යසාධනය විශ්ලේෂණය කිරීමද සිදු කරන ලදී.

**2.7 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ අදාළ වාර්තා ප්‍රකාශයට පත් කිරීම.**

- **වාර්ෂික වාර්තාව 2013**

  මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට මත්තෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මහජනතාවට නිකුත් කළ යුතු අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව එනම් 2013 වාර්ෂික වාර්තාව, 2014 මැයි මස දී ප්‍රකාශයට පත් කෙරිණි.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2014**

  මෙම වාර්තාව අදාළ වර්ෂයේ ජූනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, සෑම වසරකම නිකුත් කළ යුතු අතර, ඒ අනුව, 2014 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2014 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2015**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වන වගන්ති යටතේ ඉදිරිපත් කෙරෙන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව 2015 සහ 7, 8 සහ 9 වන වගන්ති යටතේ ඉදිරිපත් කළ යුතු අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2015 යන වාර්තා දෙකෙන් සමන්විත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2015 ඔක්තෝම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී.

## 3. පාලන හා ගිණුම්

### 3.1. සංවිධාන ව්‍යුහය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 65 කින් සමන්විත වේ. ඒ අනුව, පහත සඳහන් කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරයි.

වගුව 3:කාර්ය මණ්ඩල විස්තර - 2014 (2014.12.31 දිනට)

| තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට පුරවා ඇති සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01[අ] | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | |
| අධ්‍යක්ෂ<br>ශ්‍රී. ලං. ප. සේ. | 02 | - | 02 |
| ශ්‍රී. ලං. ක්‍රි. සේ. | 01 | 01[ඇ] | - |
| ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ප. සේ. | 09 | 04 + 02[ආ] + 01[ඇ] | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ක්‍රි. සේ. | 04 | 04 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ග. සේ. | 01 | - | 01 |
| ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| සංඛ්‍යාලේඛනඥ | 01 | - | 01 |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| පර්යේෂණ සහකාර | 06 | 03 | 03 |
| සංවර්ධන සහකාර | 06 | 03 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 | 12 | 01 |
| රියැදුරු | 06 | 04 | 02 |
| කා.කා.ස | 09 | 07 | 02 |
| **එකතුව** | **65** | **45** | **20** |

(අ)ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිලධාරියකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබයි.

(ආ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකු සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකක ක්‍රියා කරනු ලැබේ.

(ඇ)විදේශ අධ්‍යයන නිවාඩු ලබා ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අනුයුක්තව සිටින බඳු උපදේශකවරියක ගේ සේවය ද මෙම දෙපාර්තමේන්තුවට ලැබේ.

## 3.2 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීම සඳහා විදේශ ශිෂ්‍යත්ව සහ දේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී කර වූ අතර ඒ තුළින් ඔවුන්ගේ ඵලදායීතාව වැඩි දියුණු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යයක්ෂමව කරගෙන යාම අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩලය සඳහා 2014 දී ලබා දෙන ලද දේශීය හා විදේශීය පුහුණුවීම් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

### 3.2.1 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

**වගුව 4:(අ) දේශීය පුහුණුවීම්**

| නම | තනතුර | පුහුණු ආයතනය සහ වැඩසටහන | පුහුණු කාලය |
|---|---|---|---|
| ඩබ්.එච්.ඒ.විමලජීව මිය | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - IFRS Application Level Program | 2014 ජනවාරි 06 සිට 17 දක්වා |
| ජේ.ඒ.ඩී.ආර්.ජයසූරිය මිය | සහකාර අධ්‍යක්ෂ | නිපුණතා සංවර්ධන අරමුදල - Employment Income & Operation of PAYE Scheme & S Vat | 2014 ඔක්තෝබර් 31 |
| ඩී.එම්.එස්.ඒ.නිරෝෂණ මහතා | සහකාර අධ්‍යක්ෂ | Center for Banking Studies - Applied Econometrics Practical Approach using e-views software | 2014 ජනවාරි 16 සිට 2014 ජූනි 05 දක්වා |
| සී.කේ.විතාන මිය | සංවර්ධන සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) Intermediate Level | 2014 ජනවාරි 12 සිට සති 10 ක් |
| ඩබ්.එම්.එම්.පී.පෙරේරා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) Intermediate Level | 2014 ජනවාරි 12 සිට සති 10 ක් |
| ටී.පී. ආරියතිලක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) Intermediate Level | 2014 ජනවාරි 12 සිට සති 10 ක් |
| එස්.ඩබ්.එස්.එන්. දිලන්තිකාමිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) Intermediate Level | 2014 ජනවාරි 12 සිට සති 10 ක් |
| ඩබ්.ආර්.මධුවන්ති මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාරහේන්පිට - සේවා ආරම්භක පුහුණු පාඨමාලාව | 2014 අගෝස්තු 25 සිට සැප්තැම්බර් 05 දක්වා |
| ජේ. එස්. දිල්මිණී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාරහේන්පිට - සේවා ආරම්භක පුහුණු පාඨමාලාව | 2014 අගෝස්තු 25 සිට සැප්තැම්බර් 05 දක්වා |
| එම්.ජී.ආර්.එස්.ධනපාල මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාරහේන්පිට - සේවා ආරම්භක පුහුණු පාඨමාලාව | 2014 අගෝස්තු 25 සිට සැප්තැම්බර් 05 දක්වා |

වගුව 4: (ආ)විදේශීය පුහුණුවීම් /වැඩමුළු

| නම | තනතුර | පුහුණු ආයතනය සහ වැඩසටහන | පුහුණු කාලය |
|---|---|---|---|
| කේ.එම්.මහින්ද සිරිවර්ධන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | IMF - IMF/WB Spring Meetings in Washington DC, USA | 2014 අප්‍රේල් 06 සිට 14 දක්වා |
| | | 5th Annual dbAccess Asia Conference 2014 - Singapore | 2014 මැයි 20සිට 22 දක්වා |
| | | Investor Meeting 2014 - USA | 2014 සැප්තැම්බර් 01 සිට 11 දක්වා |
| | | Investor Meeting 2014 - UK & Hong Kong | 2014 ඔක්තෝබර් 26 සිට 31 දක්වා |
| | | Public Finance Management (PFM) - Pakistan | 2014 නොවැම්බර් 24 සිට 30 දක්වා |
| එම්.කේ.සී.සේනානායක මහතා | සහකාර අධ්‍යක්ෂ | Ph.D. Programme in Economics at the University of New South Wales -Australia | 2011 සිට 2014 දෙසැම්බර් 31 දක්වා |
| එස්.පී.කිරිවත්තුඩුවගේ මහතා | සහකාර අධ්‍යක්ෂ | Ministry of Finance Japan - Economic Policies 2014 | 2014 මැයි 10 සිට ජූනි 07 දක්වා |
| එම්.ඒ.එන්.සී.සෙනවිරත්න මිය | සහකාර අධ්‍යක්ෂ | JDS,Japan - Macro Economics and Development Economics | 2013 අගෝස්තු 22 සිට 2015 ඔක්තෝම්බර් දක්වා |
| එච්.ඩී.ඒ.රුක්ෂිණී මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | IMF Singapore Regional Training Institute - Macroeconomic Diagnostic | 2014 පෙබරවාරි 24 සිට මාර්තු 07 දක්වා |
| ආර්.එම්.කේ.එම්.ලක්මිණී මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | IMF Singapore Regional Training Institute - Macroeconomic Management and Fiscal Policy | 2014 ඔක්තෝබර් 05 සිට 18 දක්වා |

## 3.3 මූල්‍ය පරිපාලනය

2014 වර්ෂය සඳහා 238 ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදන යොදාගත් ආකාරය පහත දැක්වේ.

**වගුව 5: අයවැය ප්‍රතිපාදන උපයෝජනය - 2014**

| වියදම් විස්තරය | 2014 ඇස්තමේන්තු රුපියල් | 2014 ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2014 තථ්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **74,680,000** | **74,770,000** | **74,731,475.18** |
| පුද්ගල පඩිනඩි | 24,000,000 | 22,817,000 | 22,811,513.37 |
| ගමන් වියදම් | 3,900,000 | 2,246,000 | 2,232,318.80 |
| සැපයීම් | 2,480,000 | 2,340,000 | 2,334,912.55 |
| නඩත්තු වියදම් | 2,300,000 | 2,431,000 | 2,427,889.83 |
| ගිවිසුම්ගත සේවා | 41,500,000 | 44,351,000 | 44,340,136.61 |
| මාරු කිරීම් හා වෙනත් | 500,000 | 585,000 | 584,704.02 |
| **මූලධන වියදම්** | **1,120,000** | **1,120,000** | **1,003,839.19** |
| පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් | | | |
| අත්පත්කර ගැනීම් | 720,000 | 720,000 | 711,809.19 |
| ප්‍රාග්ධන මාරු කිරීම් | | | |
| හැකියා වර්ධනය | 400,000 | 400,000 | 292,030.00 |
| **මුළු වියදම** | **75,800,000** | **75,890,000** | **75,735,314.37** |

### (ii) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම

2014 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

**වගුව 6: අත්තිකාරම් ගිණුම**

| විස්තරය | අනුමත සීමාව රුපියල් | තථ්‍ය සීමාව රුපියල් |
|---|---|---|
| 1. උපරිම වියදම් සීමාව | 2,500,000 | 2,498,354.00 |
| 2. අවම ලැබීම් සීමාව | 1,000,000 | 1,568,963.13 |
| 3. උපරිම හර ශේෂ සීමාව | 10,000,000 | 7,678,795.36 |

**විගණන විමසුම**

2014 වර්ෂය තුළ මුදල් අමාත්‍යාංශයේ කළමණාකරන විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් 05කට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 05 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.